# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1960/66 - 2016 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2016.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය)**

**විනිමය පාලන පනතේ 22(4) වගන්තිය යටතේ වන අවසරය**

විනිමය පාලන පනතේ 22(3) වගන්තිය සහ 22(4) වගන්තිය සමග කියැවෙන එකී පනතේ 44 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම මෙම නියෝගය මගින්:

(i) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන භාණ්ඩ සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් 1993 මාර්තු 26 දිනැති අංක 759/15 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* ලබා දී තිබූ නිදහස් කිරීම අවලංගු කරනු ලැබේ;

(ii) මෙම විධානයේ දිනය වන විට ශ්‍රී ලංකාවෙන් පිටත රඳවා ගෙන ඇති එවැනි ඕනෑම ගෙවීමක් 2016 මැයි 01 දිනට පෙර ශ්‍රී ලංකාවට රැගෙන ඒම අවශ්‍ය වේ;

(iii) මෙම විධානයේ දිනය හෝ ඉන්පසුව ලැබෙන එවැනි ඕනෑම ගෙවීමක්, භාණ්ඩ අපනයනය කිරීමේ දින සිට දින 90ක් ඇතුළත ශ්‍රී ලංකාවට රැගෙන ඒම අවශ්‍ය වේ.

රවී කරුණානායක,
මුදල් ඇමති.

2016 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

04-1028

1A - G 23288 — 26 (2016/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.